# එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික විද්‍යාත්මක හා සංස්කෘතික සංවිධානය

චම්මික මල්ලවආරච්චි

අප අවට ලෝකය ඉතා වේගයෙන් වෙනස් වෙමින් පවතින අතර ඉතා ගැඹුරු කම්පනයන්ට ද ගොදුරු වෙමින් පවතින්නේ ය. ලෝකයේ පැරණි මුහුණුවර දක්නට නැති අතර සුපුරුදු අංග ලක්ෂණ මැකීයාම නිසා නව මුහුණුවර ද හඳුනාගත නොහැකි තත්ත්වයක පවතී. අපේ අනාගතය පිළිබඳව නම් එක් කරුණක් පැහැදිලි ය. එනම් එය මුළු මහත් ලෝකයාටම පොදු වශයෙන් බලපාන අනාගතයක් විය යුතු බවයි. එසේ නොවුනහොත් ලෝකයට අනාගතයක් නැත්තටම නැති වන බව ය.

එය පොදු අනාගතයක් වන්නට නම් අපේ සම්පත්, දැනුම, බලය හා සැඟවී ඇති හැකියාවන් බෙදාහදා ගන්නේ කෙසේදැයි අප දැන සිටිය යුතුය. එසේ දැන සිටීමට නම් අපට ඉගෙනීම අවශ්‍ය වන්නේ ය. ඉදිරි අනාගතයේදී ඇතිවන නොදියුණුකම, පරිසර දූෂණය, අධික ජනගහනය හා හිංසාව වැනි භයානක තත්ත්වයන්ට මුහුණදීම සඳහා අද අපට ඇති උපරිම අවස්ථාව නම් අධ්‍යාපනය යි.

මෙම අරමුණ සහිතව දෙවන ලෝක යුද්ධයේ අවසාන සමයේ ජාත්‍යන්තර සංවිධානයක් බිහි කරන ලදී. එම සංවිධානය වෙනෙකක් නොව එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික විද්‍යාත්මක හා සංස්කෘතික(UNESCO)සංවිධානය යි. එකී සංවිධානය එක්සත් ජාතීන්ගේ සංවිධානයේ විශේෂඥ නියෝජිත ආයතනයක් ලෙස වර්ෂ 1946 නොවැම්බර් මස 04 වෙනිදා සිට ක්‍රියාත්මක විය. යුනෙස්කෝ සංවිධානයේ ප්‍රධානතම අරමුණ වන්නේ අධ්‍යාපනය, විද්‍යාව, සංස්කෘතිය හා සන්නිවේදනය ඔස්සේ ජාතීන් අතර සහයෝගී ක්‍රියාකාරිත්වය වර්ධනය කිරීමෙන් ලෝක සාමයට හා ආරක්ෂාවට දායක වීම යි.



යුනෙස්කෝ සංවිධාන මූලස්ථානය

යුනෙස්කෝ සංවිධානයේ ඉතිහාසය පිළිබඳව සලකා බැලීමේදී කැපී පෙනෙන ලක්ෂණයක් නම් මුලින් ම යුනෙස්කෝව වෙනත් ජාත්‍යන්තර සංවිධානයක් ලෙස බිහිවීමයි. එනම් යුනෙස්කෝව 1925 අගෝස්තු 09 වන දින පිහිටුවන ලද බුද්ධිමය සහයෝගිතාව පිළිබඳ අන්තර්ජාතික ආයතන වෙනුවට ගොඩනැගූ සංවිධානයකි. සංධිස්ථාන වර්ෂය වන 1945 දී ලෝකය පිළිබඳ නව හැඟීමක උපත දක්නට ලැබිණ. එලෙස පසු කාලයේදී මෙම සියවසේ තථාසාංක වලින් එකක් බවට පත් විය. විවිධ ජාතීන් අතර පරතරය නැති කොට ඔවුනොවුන් අතර අවබෝධය පැතිරවීමට කාලය එළඹී තිබුණි. පශ්චාත් යුද්ධ සමයේ දැඩි පීඩනය හා කලකිරීම තුළ වඩා හොඳ අනාගතයක සිහින මැවූ ජාතීන් යුනෙස්කෝ සංවිධානයේ අඩිතාලම දැමීය. එම කාලවකවානුව තුළ සංවිධානයේ කාර්යය භාරය වූයේ ලෝක ව්‍යාප්ත ප්‍රතිසංස්කරණ කාර්යයට සහභාගිවීමෙන් අධ්‍යාපනය, විද්‍යාව හා සංස්කෘතිය ඇසුරින් ජාතීන් අතර සහයෝගීත්වය ප්‍රවර්ධනය කිරීමෙන් සාමයට හා ආරක්ෂණයට දායකවීම විය. එලෙස යුනෙස්කෝ සංවිධානය බිහි වූයේ 1945 නොවැම්බර් 16 වන දින ලන්ඩනයේ පැවති ජාත්‍යන්තර සම්මේලනයක අවසානයේ දී ය. එහි ප්‍රථම මහා සම්මේලනය ඊට වසරකට පසු 1946 නොවැම්බර් මස 10 දින සිට දෙසැම්බර් මස 20 වන දින තෙක් පැරිසියේ පවත්වනු ලැබීය.

ඊට දින හතරකට පසු යුනෙස්කෝ සංවිධානය එක්සත් ජාතීන්ගේ විශේෂිත නියෝජිත ආයතනයක් බවට පත් විය. එහිදී යුනෙස්කෝව සිය ව්‍යවස්ථාව ලන්ඩන් නුවරදී කෙටුම්පත් කර 1946 නොවැම්බර් මස සිට ක්‍රියාත්මක කරනු ලැබීය. පළමුවෙන් 1946 රටවල් 20 ක සහභාගිත්වයෙන් ප්‍රතිස්ථාපනය වූ යුනෙස්කෝව නූතනය වනවිට සාමාජික රටවල් 184 කින් සමන්විත විය.

යුනෙස්කෝ සංවිධානයේ ප්‍රධාන අරමුණ නම් අධ්‍යාපනය, විද්‍යාව, සංස්කෘතිය සහ තොරතුරු හුවමාරුව තුළින් ලෝකයේ රාජ්‍ය අතර බුද්ධිමය සහයෝගිතාවය ප්‍රවර්ධනය කිරීමෙන් ලෝකයේ සාමය හා සුරක්ෂිතතාවට දායක වීම වේ. තවද, යුනෙස්කෝව ලෝකයේ සංවර්ධනය උදෙසා ද ඇස යොමා ඇති අතර සාමාජික රටවල වෙනත් ප්‍රධාන ප්‍රශ්නයන්ට ද විසඳුම් ගෙන ඒම සඳහා හැකි පමණින් සහභාගි වේ.

මේ අනුව මෙම සංවිධානය ලෝකයේ පුළුල් සංකීර්ණ ප්‍රශ්න නිරාකරණය කිරීමට සහභාගී වන්නකි. ලෝකයේ යුද්ධ හා වෙනත් විවිධ ගැටුම් මිනිසාගේ මනස තුළින්හට ගැනෙන හෙයින් මිනිසාගේ මනසට සාමය තහවුරු කිරීම සඳහා ද හැඩගස්වාලිය යුතුයයි යුනෙස්කෝ ව්‍යවස්ථාවෙන් පැවසේ. සාමය සුරැකීම උදෙසා ලෝකය පුරා විසිරී සිටින බුද්ධිමතුන්ගේ බුද්ධිමය සහයෝගය ලබා ගැනීමට උත්සාහ කිරීම ද තවත් අරමුණු අතර ප්‍රධාන එකකි.

යුනෙස්කෝව මෙකී අරමුණ සපුරා ගැනීම පිණිස සෑම රටකම ජනතාවට වඩා ඵලදායි ලෙස ස්වකීය සංවර්ධනය තමන් විසින් ම හසුරුවා ගැනීමට හැකිවන අයුරින් අධ්‍යාපනය ව්‍යාප්ත කොට ඊට මග පෙන්වයි. පරිසර කළමනාකරණයේ වැඩි දියුණුවට සහ වඩා විධිමත් ස්වාභාවික සම්පත් භාවිතයට ඉවහල් වන්නාවූ විද්‍යාත්මක හා තාක්ෂණික පදනම සකස් කිරීමට උපකාරී වෙයි. සංස්කෘතික අනන්‍යතාවයට හා විවිධත්වයට හානි නොකර නවීකරණයේ උපරිම වැඩි අයිතින් ගැනීමට ඉවහල් වන අයුරින් ජාතික සංස්කෘතික සාරධර්ම දිරි ගැන්වීම හා සංස්කෘතික උරුමය රැකදීම සිදුකරයි. ප්‍රකාශන නිදහසට කුමන හෝ බාධාවක් නොකොට වඩා හොඳ තුලිතතාවක් සහිතව වඩාත් පුළුල් ලෙසින් තොරතුරු බෙද හැරීමේ නිදහස් රටාවක් ඇති කිරීම සඳහා සන්නිවේදන ක්‍රම සංවර්ධනය කරයි. මානව හිමිකම්, සාධාරණත්වය සහ සාමය සාක්ෂාත් කර ගැනීමේ උපකරණ ලෙස සලකා සමාජවිද්‍යාවන් ආවරණය කරයි.

මෙකී අරමුණු අතරින් අධ්‍යාපනය, අසාක්ෂරතාවය පිටු දැකීම, සියලු දෙනාම සඳහා මූලික අධ්‍යාපනයත් උසස් අධ්‍යාපනයත් සංවර්ධනය කිරීමට රුකුලක්වීම, ගුරුවරුන් හා දේශීය පරිපාලනයන් පුහුණු කිරීමට සහයවීම, පාසල් ඉදිකිරීම සහ උපකරණ සැපයීම, ප්‍රවර්ධනය කිරීම හා විද්‍යාත්මක හා තාක්ෂණ විශේෂඥයන්ගේ ලෝක ව්‍යාප්තියේ ඇති අසම තුලිතතාව නිවැරදි කිරීම, ස්වාභාවික විවාද, ජෛව ගෝලය, භූ විද්‍යාව, සාගර විද්‍යාව සහ ජල විද්‍යාව පිළිබඳ අන්තර් ජාතික සහභාගිත්වය වැඩි දියුණු කිරීම, පරිසරයට ඇති තර්ජන පිළිබඳ මහජන මතය අවදි කිරීම, විද්‍යාව සහ සංස්කෘතිය අතර සබඳතාවන්ට වඩා යහපත් අවබෝධයක් ඇති කිරීමට දායකවීම යන්න ආදී අරමුණු උදෙසා ඉතාමත් සාර්ථක ඵල නෙලා ගැනීමට යුනෙස්කෝ සංවිධානයට හැකියාව උදා වී තිබේ.

**යුනෙස්කෝ සංවිධානයේ ප්‍රධාන අරමුණ නම් අධ්‍යාපනය, විද්‍යාව, සංස්කෘතිය සහ තොරතුරු හුවමාරුව තුළින් ලෝකයේ රාජ්‍ය අතර බුද්ධිමය සහයෝගිතාවය ප්‍රවර්ධනය කිරීමෙන් ලෝකයේ සාමය හා සුරක්ෂිතතාවට දායක වීම වේ.**

මෙම අරමුණු හා පරමාර්ථ කරා ළඟාවීම සඳහා යුනෙස්කෝ සංවිධානයේ මහා සමුළුව මගින් සිදු කරනු ලබන පරිපාලන ව්‍යුහය ඉතාමත් සාකච්ඡාවට බඳුන් විය යුතු කරුණකි. එහිදී දෑ අවුරුද්දකට වරක් 184 ක් වූ සාමාජික රටවල සාමාජිකයින් මහා සම්මේලනයට කැඳවා ඔවුන් ඉදිරියේ යුනෙස්කෝ වැඩ පිළිවෙළ තබනු ලැබේ. මෙම වැඩපිළිවෙලට අදාළ සියලු ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සාමාජික රටවලින් සපයනු ලැබේ. ප්‍රතිපාදන සාමාජික රටවල් තම තමන්ගේ ශක්ති ප්‍රමාණය අනුව සැපයීම සිදු කරයි. මෙකී ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමේ විධායක කමිටුව සාමාජිකයින් 51 කින් යුක්තය. මෙම පිරිස යුනෙස්කෝ ලේකම් කාර්යාල මගින් මෙම සියලු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කරනු ලැබේ. මේ සඳහා පැරීසියේ යුනෙස්කෝ මූලස්ථාන ලේකම් කාර්යාලයේ හා ක්ෂේත්‍රයේ මෙම පුළුල් පරිපාලන ජාලය හෙවත් ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සඳහා සාමාජික රටවල විවිධ ජාතිකයින් 130 ක් පමණ සේවයේ යොදවා ඇත. යුනෙස්කෝවේ ප්‍රධාන පරිපාලන විධායකයා අධ්‍යක්ෂ ජනරාල්වරයෙක් වන අතර නිල කාලය වර්ෂ හයකි.

වර්ෂ 1995 දී සිට සාමාජික රටවල් 177 ක් එක් වී යුනෙස්කෝ ජාතික මණ්ඩල පිහිටුවා සෑම කෙනෙකුම තම රටවල අධ්‍යාපනික, විද්‍යාත්මක, සංස්කෘතික හා ජනසන්නිවේදන කටයුතු ආදිය දියුණු කිරීමේ යෙදී සිටිති. මෙම ජාතික කොමිෂන් සභා මගින් තම තමන්ගේ රටවල ක්‍රියාත්මක වන සියලු ව්‍යාපෘති පිළිබඳ වාර්තා තොරතුරු යුනෙස්කෝ මූලස්ථානයට සපයමින් ඒ ඒ රටවල් දියුණුව උදෙසා සම්මන්ත්‍රණ, සාකච්ඡා, වැඩමුළු සංවිධානය කොට ක්‍රියාත්මක කරනු ලැබේ.

මේ සම්බන්ධයෙන් යුනෙස්කෝව ප්‍රධාන සම්බන්ධීකරණ ආයතන හැටියට ක්‍රියාකරයි. සාමාජික රටවල් 158 පිහිටුවා ඇති යුනෙස්කෝ ජාතික කොමිෂන් සභාවලට අතිරේකව යුනෙස්කෝ නියෝජන, සාමාජික රටවල් 138 ක් නිත්‍ය නියෝජිතයින් වශයෙන් පත් කර ඇත.

එසේම ලොව පුරා පිහිටුවා ඇති රාජ්‍ය නොවන සංවිධාන 585 කට වැඩි සංඛ්‍යාවක් යුනෙස්කෝව සමග අන්‍යොන්‍ය බැඳියාවකින් තොරතුරු හුවමාරු කර ගනී.

බොහෝ රටවල ජාතික ශාඛා පිහිටුවා ඇති රාජ්‍ය නොවන ආයතන ඔවුන්ගේ සංවිධාන මගින් අධ්‍යාපනඥයින්, විද්‍යාඥයින්, කලාකරුවන්, නිර්මාණකරුවන්, ලේඛකයින්, පුස්තකාලයාධිපතීන්, සංගීතඥයින්, පරිගණක විශේෂඥයින්, මාධ්‍යවේදීන්, ප්‍රකාශකයින් යනාදී විශේෂඥයින් යුනෙස්කෝ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කරවීම සඳහා සහායවීමට යොමු කර ඇත.

1947 වර්ෂය වන විට යුනෙස්කෝව මහජනයාගේ වහා සපුරාලිය යුතු අවශ්‍යතා ගැන සොයා බැලීමට ඔස්ට්‍රියාව, චෙකොස්ලෝවැකියාව, ග්‍රීසිය, ඉතාලිය, පෝලන්තය හා යුගොස්ලෝවියාව යන රටවලට දූත කණ්ඩායම් යවා තිබුණි. 'The Teacher and the post-war child' නමින් පත්‍රිකාවක් ග්‍රීක රජයේ අනුග්‍රහය යටතේ පළ කරනු ලැබීය. පසුව එය ජර්මානු, ඉතාලි, හීබ්‍රු සහ රොමේනියානු භාෂා වලට ද පරිවර්තනය කිරීම සිදු කරන ලදී. තරුණසේවා කඳවුරු ගණනාවක් සංවිධානය කරනු ලැබූ අතර හයිටි, චීනය සහ නැගෙනහිර අප්‍රිකාව යන රටවල මූලික අධ්‍යාපනය සඳහා නියමු ව්‍යාපෘති දියත් කෙරිණ.

මුල් යුනෙස්කෝ මහා සම්මේලනයට ඉදිරිපත් කරන ලද වැඩසටහනේ පොත් සහ වෙනත් කියවන ද්‍රව්‍ය නොමිලේ බෙද හැරීම ප්‍රවර්ධනය කිරීමේ ක්‍රියාමාර්ගයක් ද, කෙටියෙන් විස්තර කොට තිබුණි. පුස්තකාලයාධිපතීන් හුවමාරු කර ගැනීමේ වැඩසටහනක් ආරම්භ කොට පාසල්වල පුස්තකාල සමීක්ෂණය කිරීමට සූදානම් කෙරිණ. තෝරා ගත් ජාතික ග්‍රන්ථ ලේඛන පළ කරන ලෙස සියලුම රටවලින් ඉල්ලීමක් කෙරිණ.

මුල් යුනෙස්කෝ මහා සම්මේලනයට ඉදිරිපත් කරන ලද වැඩසටහනේ පොත් සහ වෙනත් කියවන ද්‍රව්‍ය නොමිලේ බෙද හැරීම ප්‍රවර්ධනය කිරීමේ ක්‍රියාමාර්ගයක් ද කෙටියෙන් විස්ත කොට තිබුණි. පුස්තකාලයාධිපතීන් හුවමාරු කර ගැනීමේ වැඩසටහනක් ආරම්භ කොට පාසල්වල පුස්තකාල සමීක්ෂණය කිරීමට සූදානම් කෙරිණ. තෝරාගත් ජාතික ග්‍රන්ථ ලේඛන පළ කරන ලෙස සියලුම රටවලින් ඉල්ලීමක් කෙරිණ. UNESCO Bulletin for Libraries නම් නිවේදනයේ ප්‍රථම සංස්කරණය එළිදක්වුණු අතර යුනෙස්කෝව මගින් මධ්‍යම තොරතුරු සේවයක් ද පිහිටුවනු ලැබී ය.

එම පුළුල් වැඩසටහනේ පුළුල් අංගයක් වශයෙන් යුද්ධයෙන්

විනාශ වූ ප්‍රදේශවලට අලුතින් විද්‍යාත්මක හා තාක්ෂණික උපකරණ සැපයීමටත් ලෝක ව්‍යාප්ත රේඩියෝ ජාලයක් බිහිවීමටත් යුද්ධයට යොමුවන නොඉවසුම් ගති අධ්‍යයනය කිරීමටත් සැලසුම් ඉදිරිපත් කෙරිණ. 1947 දී රියෝද ජෙනරෝ, කයිරෝව, නැන්කින්ග් සහ නවදිල්ලි යන ස්ථානවල ක්ෂේත්‍ර විද්‍යා සහයෝග කාර්යාල පිහිටුවනු ලැබීය. සමාජවිද්‍යා අංශයේ වැදගත් ව්‍යාපෘතියක් ලෙස තෝරාගන්නා ලද්දේ "අන්තර් ජාතික අවබෝධය" පිළිබඳ සියලුම කරුණු අධ්‍යයනය කිරීමයි. අනෙක් ව්‍යාපෘති අතරට පර්යේෂණ කාර්යය මණ්ඩල සහ සම්පත් පිළිබඳ ජගත් ලේඛනයක් පිළියෙල කිරීම සහ තුලනාත්මක නීති ඇතුළත් විය.

යුනෙස්කෝ යන වචනයේ අන්තර්ගතයේම එහි සීමිත විෂය සීමාවක් දැකිය හැකිය. විශේෂයෙන් ම සෙසු අන්තර් ජාතික සංවිධාන සඳහා මෙන් යුනෙස්කෝව මගින් ද අවධානය යොමු කළ යුතු සේවාවන් රාශියක් පවතී. එම සේවාවන් සැපයීම කළ යුතු අධ්‍යයන ක්ෂේත්‍ර ලෙස අධ්‍යාපනය, විද්‍යාව හා සංස්කෘතිය යන්න ව්‍යවස්ථාව තුළින් ම ගොඩනගාගෙන තිබේ. එනම් වෙනත් අන්තර් ජාතික සංවිධානවලට වඩා වැඩි අවධානයක් එකී ක්ෂේත්‍ර කෙරෙහි යුනෙස්කෝව විසින් ඉටුකිරීමට බැඳී සිටී.

යුනෙස්කෝව මගින් සේවාවන් සැපයුම කරනු ලබන විෂය ක්ෂේත්‍ර අතරින් ප්‍රධානම අංශය ලෙස අධ්‍යාපන ක්ෂේත්‍රය හැඳින්විය හැකි ය. මෙහිදී අධ්‍යාපනය කුමක් ද යන්න නියමාකාරව හඳුනාගෙන ප්‍රධාන තීරණායක සංකල්ප තුනක් මත සිට අධ්‍යාපනය උදෙසා විවිධ සේවාවන් ක්‍රියාත්මක කරනු ලබයි. එහිදී සැමටම මූලික අධ්‍යාපනය, 21 වන සියවස සඳහා වූ අධ්‍යාපනය, සමස්ත අධ්‍යාපනයේ ප්‍රගතිය උදෙසා ක්‍රියාකාරීත්වය යනාදී සංකල්ප මූලික කරගනු ලැබෙයි.

අධ්‍යාපනය පිළිබඳ යුනෙස්කෝව විසින් ගනු ලැබූ තීරණ අතර ඉතාමත් වැදගත්ම කරුණ නම් "සැමටම මූලික අධ්‍යාපනය" ලබා දිය යුතුයි යන සංකල්පයයි. මෙම සංකල්පය සාක්ෂාත් කරගැනීමේ අරමුණින් ලෝක සම්මන්ත්‍රණයක් පැවැත්වීමට ද යුනෙස්කෝ සංවිධානයට සිදු විය. එම සම්මන්ත්‍රය 1990 වර්ෂයේ තායිලන්තයේ සොම්තියන් හි පවත්වනු ලැබීය. මෙහිදී විශේෂයෙන් ම සඳහන් කළ යුතු කරුණක් නම් මෙම සම්මන්ත්‍රණයේ ප්‍රධාන අභිලාෂය වූයේ ලොව සැමටම ගුණාත්මක අධ්‍යාපනයක් ලැබීම සඳහා ජීවිත කාලය පුරාම ඉගෙනුම සහ නව අධ්‍යාපනික සංකල්පය සඳහා පදනම් දැමීම වේ. තව ද, මෙම මූලික අධ්‍යාපනය පිළිබඳ මූලික අධ්‍යාපනය පිළිබඳ මූලික සංකල්පය ඒ ඒ රාජ්‍යයන්හි සමාජ, සංස්කෘතික, ආර්ථික වටිනාකම්වලට ගැලපෙන පරිදි සකස් විය යුතු යැයි ද අවධාරණය කරනු ලැබිය. එසේම මෙම මූලික අධ්‍යාපනය තුළින් දරුවාට ඔහු වටා ඇති පුළුල් ලෝකයට පිවිසීමට හැකි අඩිතාලමක් ද වැටෙන සේ විෂය මාලාව සකස් විය යුතුයැයිද පිළිගැණින.

**යුනෙස්කෝව මගින් සේවාවන් සැපයුම කරනු ලබන විෂය ක්ෂේත්‍ර අතරින් ප්‍රධානම අංශය ලෙස අධ්‍යාපන ක්ෂේත්‍රය හැඳින්විය හැකි ය.**

උක්ත කරුණට පරිබාහිර ලෙස 21 වන ශතවර්ෂයේ ජීවත්වන සහ වැඩකරන්නාවූ අද ජීවත්වන දරුවන් උදෙසා වඩාත් උචිත ස්වරූපයෙන් අධ්‍යාපනය ලබා දීමට ද කටයුතු කිරීම යුනෙස්කෝව තුළින් සිදුවන තවත් සත්කාරයකි. ජීවත්වීම සඳහා අන්‍යෝන්‍ය සහයෝගය අවශ්‍ය වේගයෙන් වෙනස්වන ලෝකයකට අද ළමා පරපුර පිවිසෙමින් සිටී. එම ලෝකයට ගැලපෙන ආකාරයේ, පහසුවෙන් ගලපා ගත හැකි ස්වරූපයේ එමෙන් ම ඉදිරියට පැමිණෙන කාලය උදෙසා වූ කාලීන අධ්‍යාපනයක් අප දරුවන්ට ලබා දීම සිදු කරයි. අධ්‍යාපනයේ මූලිකම පරමාර්ථය වන දරුවාට තම රටේ සම්පත් හා සමාජ සංස්කෘතික බලවේග යටතේ ජීවත් වීමටත්, ලෝක පුරවැසියෙකු වශයෙන් පුළුල් ලොවට පිවිසීමටත් හැකියාවක් තිබිය යුතු ය. එම පරමාර්ථ මුදුන් පමුණුවාගත හැකි ආකාරයට අධ්‍යාපන ක්‍රමෝපායෙන් සහ විෂය නිර්දේශ සකස් කිරීමට අවශ්‍ය උපදෙස් හා යෝජනා යුනෙස්කෝව විසින් ලබාදීම කරනු ලබයි.

මෙකී ක්‍රමෝපායන්ට අමතරව අධ්‍යාපනයේ ප්‍රගතිය සඳහා විවිධාකාර ක්‍රියාමාර්ග යුනෙස්කෝව මගින් දියත් කර තිබේ. මෙහිදී සාමාජික රටවලට සෘජුවම සපයනු ලබන ආධාරයන්ට අතිරේකව ජාත්‍යන්තර හා ප්‍රාදේශීය සහයෝගිතා ව්‍යාපෘති යටතේ ඒ ඒ රටවල මානව හා මූල්‍යම සම්පත් මනා ලෙස කළමනාකරණය කොට එම සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ගැනීම උදෙසා අවශ්‍ය උපක්‍රම පෙන්වා දීම හා මග පෙන්වීම සිදුකරනු ලබයි.

ගුරු පුහුණුව, ගැහැනු දරුවන්, කාන්තාවන්, අධ්‍යාපන ක්ෂේත්‍රයට වැඩි වැඩියෙන් එක්කර ගැනීම, ජාත්‍යන්තර සහයෝගිතාව සහ සාමය ළඟා කරගැනීම උදෙසා සුදුසු වනසේ අධ්‍යාපන ව්‍යාපෘති දියත් කිරීම, පරිසර අධ්‍යාපනය, ඒඩ්ස් වසංගතය පැතිරීයාම වැලැක්වීම සඳහා වූ අධ්‍යාපනය, පෝෂණ ආහාර පිළිබඳ අධ්‍යාපනය, විද්‍යාත්මක හා තාක්ෂණික, වෘත්තිමය හා කාර්මික යනාදී ව්‍යාපෘතීන් යුනෙස්කෝ අධ්‍යාපන වැඩසටහන් වලින් කොටසක් වන අතර, විශේෂයෙන් ම 21 වන ශතවර්ෂයට ගලපාගත හැකි අධ්‍යාපන ප්‍රමුඛතා යටතේ සංවිධානය කර ක්‍රියාත්මක කර ඇත. එමෙන් ම යුනෙස්කෝවේ මූලික අරමුණුවලට ගැලපෙන සේ සාමාජික රටවල ශිෂ්‍යයන්, ගුරුවරුන්, ඔවුන්ගේ සරසවි උපාධි හා ඩිප්ලෝමා ආදිය පිළිගෙන ඔවුන්ගේ සුදුසුකම්වලට ගැලපෙන සේ ලෝක ප්‍රජාවගේ සේවය උදෙසා බෙදහැරීමට හැකි පියවර ද ගෙන ඇත.

**ලෝකය පුරා විසිරී ඇති ශ්‍රේෂ්ඨ කෘතීන් සොයා, ඒවා පරිවර්තනය කිරීම, පාරම්පරික සංගීතය වාර්තා කර තැබීමට ද ඔවුන් පියවර ගෙන ඇත.**

ලෝකය පුරා විසිරී ඇති ශ්‍රේෂ්ඨ කෘතීන් සොයා, ඒවා පරිවර්තනය කිරීම, පාරම්පරික සංගීතය වාර්තා කර තැබීමට ද පියවර ගෙන ඇත. මත්ද්‍රව්‍ය අනිසි ලෙස ප්‍රවාහනය කිරීම වලක්වාලීමට උත්සාහ ගෙන ඇති අතර, මෑතක සිට ඒඩ්ස් වසංගතය පැතිර යාම වලක්වාලීම සඳහා උදව් වීමට පැරිසියේ යුනෙස්කෝ මූලස්ථානයේ මධ්‍යස්ථානයක් පිහිටුවා, එමගින් ලොව පුරා පැතිරී ඇති මෙම මාරාන්තික වසංගතය පිළිබඳ අදාළ තොරතුරු එක්රැස් කර, අධ්‍යාපනික වැදගත්කමකින් යුත් මෙම තොරතුරු ලොව පුරා සංවිධානය කර ඇති අධ්‍යාපනික ව්‍යාපෘති මගින් පතලකර හැරීම ප්‍රමුඛතා යටතේ දියත් කර ඇත. ඒඩ්ස් උවදුර පැතිරයාම මැඩපැවැත්වීම සඳහා යුනෙස්කෝ මූලස්ථානයේ පිහිටුවා ඇති මධ්‍යස්ථානය ඒඩ්ස් අධ්‍යාපනය පිළිබඳ සම්පත් මධ්‍යස්ථානය හැටියට හැඳින් වේ. (ACERC)

යුනිට්වින් (UNITWIN) ව්‍යාපෘතිය, ලෝකයේ විශ්ව විද්‍යාල අතර සහයෝගිතාවයෙන් අරමුණු කර ඇත්තේ සංවර්ධනය වෙමින් පවත්නා රටවල උසස් අධ්‍යාපනය සඳහා උදව්වීමටත්, ප්‍රාදේශීය, උප ප්‍රාදේශීය, අන්තර් - ප්‍රාදේශීයව ලෝකය පුරා විසිරී ඇති විශ්ව විද්‍යාල විද්‍යාත්මක ආයතන සියල්ල හසුවන සේ එකිනෙකට සම්බන්ධ වූ හෙවත් ජාලයක් හැටියට සලකා පොදු පරමාර්ථයක් සපුරා ගැනීමේ හැඟීමෙන් ඒවා හද වඩා ගැනීමටත් ය. අධ්‍යාපනයේ විවිධ එල්ලයන් ඔස්සේ යුනෙස්කෝව, වාර්ෂික,

**යුනෙස්කෝව ලෝකයේ සංවර්ධනය උදෙසා ඇස යොමා ඇති අතර සාමාජික රටවල වෙනත් ප්‍රධාන ප්‍රශ්නයන්ට ද විසඳුම් ගෙන ඒම සඳහා හැකි පමණින් සහාය වේ. මේ අනුව මෙම සංවිධානය ලෝකයේ පුළුල් සංකීර්ණ ප්‍රශ්න නිරාකරණය කිරීමට සහභාගි වන්නකි.**

වාර්ෂික ප්‍රකාශන, ලේඛනාදිය හා පොත්පත් ද ලොව පුරා බෙද හරියි. 1991 පළමුවරට නිකුත් කරන ලද අධ්‍යාපනය පිළිබඳ ලෝක වාර්තාව, ලෝකයේ අද පවත්නා ප්‍රධාන අධ්‍යාපන ප්‍රවණතා හා ප්‍රතිපත්ති විශ්ලේෂණය කර ඉදිරිපත් කර ඇත.

යුනෙස්කෝව ලෝකයේ සංවර්ධනය උදෙසා ඇස යොමා ඇති අතර සාමාජික රටවල වෙනත් ප්‍රධාන ප්‍රශ්නයන්ට ද විසඳුම් ගෙන ඒම සඳහා හැකි පමණින් සහාය වේ. මේ අනුව මෙම සංවිධානය ලෝකයේ පුළුල් සංකීර්ණ ප්‍රශ්න නිරාකරණය කිරීමට සහභාගි වන්නකි. එම නිසා යුනෙස්කෝ සංවිධානයේ ව්‍යවස්ථාව තුළ විද්‍යාත්මක යන්න යටතට සමාජ හා මානව විද්‍යාව ද අඩංගු කර තිබේ.

සමාජ හා මානව විද්‍යා ක්ෂේත්‍රයේ යුනෙස්කෝ ක්‍රියාකාරකම් අරමුණු කොට ඇත්තේ ඉගැන්වීම හා පර්යේෂණ යටතට ගැනෙන අධ්‍යයනයන් වැඩිදියුණු කොට, සංවිධානයේ, අධ්‍යාපනය, නාගරීකරණය, ජනගහනය, තරුණ පරපුර, මානව හිමිකම්, ප්‍රජාතන්ත්‍රවාදය හා සාමය යටතට ගැනෙන ප්‍රමුඛතාවයනට ගැලපෙන පරිදි යොදා ගැනීමට උනන්දු කරවීමය.

ලෝකයේ ප්‍රධාන ප්‍රශ්නයන් පිළිබිඹු වන සේ ජාත්‍යන්තර බුද්ධිමය සහයෝගිතාවය මෙහෙයවීම සහ ප්‍රශ්නයන් විසඳීම උදෙසා ගතයුතු ක්‍රියාමාර්ගයන්ට සංයුක්තව සංවිධානයේ ප්‍රධාන කාර්යයන් යුගයට ගැලපෙන සේ මෙහෙයවීම සඳහා සියලු සමාජවිද්‍යා ගලපා ගත යුතුව ඇත.

ජන විකාශනයේ හා සමාජ සංස්කෘතික පරිණාමයේ ලෝක මට්ටමේ සහයෝගිතාවය සමඟ බැඳුණු එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ජනගහන ව්‍යාපෘතිය සඳහා වූ අරමුදල යටතේ (UNFPA)දියුණු වෙමින් පවත්නා රටවලට ලබා දෙන කාර්මික සහය එම රටවල ජනගහන හා ජනසන්නිවේදන මාධ්‍යයන් පිළිබඳ ක්ෂේත්‍රයේ අධ්‍යාපනයට දැඩි අනුබලයකි.

ආර්ථික හා සමාජ අසමානතාවයට රැකියා වියුක්තියට පළමුව ගොදුරු වී ඇත්තේ ලොව පුරා විසිරී සිටින තරුණ පන්තිය හෙයින් මෙම තරුණ ප්‍රශ්න පිළිබඳව දියුණු වෙමින් පවත්නා රටවල හා කාර්මික අතින් සංවර්ධනය වූ රටවල් අතර විෂමතාව ඉතා පුළුල් හෙයින් ලෝකයේ තරුණ ප්‍රශ්න විසඳීම සඳහා ප්‍රමුඛතාවය යුනෙස්කෝව දී ඇත. මේ අනුව අනාගතය ඔප මට්ටම් කරන කරුණ පිළිබඳව සකස් කර ඇති ජංගම ව්‍යාපෘතිය වූ ජාත්‍යන්තරව තරුණයන් බෙද හැරීමේ 'නිවෙස' සහ තොරතුරු සේවය ප්‍රතිස්ථාපනය කර ඇත්තේ, තරුණයන් සමාජයේ දරන තත්වය සහ ක්‍රමය වැඩිවෙමින් පවත්නා ඔවුන්ගේ ඉල්ලීම් හා පෞද්ගලික මට්ටමෙන් තරුණයන් වෙනුවෙන් තීරණ ගන්නන් ඉදිරියේ තරුණ ප්‍රශ්නයන්ගේ යථා ස්වරූපය තැබීම සඳහා ය.

ශාරීරික, ක්‍රීඩා හා සෞඛ්‍ය අධ්‍යාපනය වැඩි දියුණු කිරීම ඇසුරින් සමාජය තුළ යහපත්, ප්‍රසන්න, අන්‍යෝන්‍ය බැඳියාවකින් යුත් සංස්කෘතික වාතාවරණය ගොඩනැංවීම අපේක්ෂා කෙරේ. ශාරීරික අධ්‍යාපනය දියුණු කිරීමෙන් සමාජය තුළ සහයෝගිතාවය, සහෝදරත්වය අන්‍ය මත ඉවසීමේ හැකියා, ඉවසීම හා විනය වර්ධනය වන අතර, තරුණ පන්තිය එකිනෙකා ගෙන් වෙන්ව හුදකලාව ජීවත්වීමට ඇති ඉඩ කඩ ඇහිරේ. තරුණයන් සඳහාම එල්ල වූ මෙම ක්‍රියාකාරකම් තුළින් අද ලෝකයේ ගිලගෙන ඇති ඒඩ්ස් වසංගතය පැතිරයාම වලක්වාලීම සඳහා තරුණයන් දැනුවත් කිරීමද අපේක්ෂා කෙරේ.

මනුෂ්‍ය සංහතියට එල්ල වී ඇති සෑම ආකාරයේම සමාජ අසාධාරණයන්ට එරෙහිව සටන් වැදීම යුනෙස්කෝවේ ප්‍රධානතම අරමුණු වලින් කොටසක් කැපකර ඇත. ජාතිවාදී, අගතිගාමී ක්‍රියාවන්ගෙන් ජනතාව බේරා ගැනීම පුරුෂයන් හා ගැහැනුන් අතර ඇති විෂමතා තුරන් කොට වැඩි වැඩියෙන් ගැහැනුන් අධ්‍යාපනය තුළට ප්‍රවිෂ්ට කර ඔවුන්ගේ සමාජ මට්ටම දියුණු කිරීම ඌන සංවර්ධිත රටවල ප්‍රගතිය උදෙසා වැඩි අනුබලයක් දීමේ පරමාර්ථයෙන්ම ප්‍රමුඛතාවය දීම සඳහා යුනෙස්කෝව 1990 වසර ගණන් වලදී ජාත්‍යන්තර ප්‍රජාව මෙහෙයවා ඇත. මෙම මෙහෙවර යථා පරිදි ඉටු කිරීම සඳහා ඌන සංවර්ධිත රටවල් සඳහාම වෙන්වූ ඒකකයක් (LDC UNIT) යුනෙස්කෝවේ සමාජ සහ මානව විද්‍යා අංශය පිහිටුවා ඇත.

විද්‍යා හා තාක්ෂණ විෂය ක්ෂේත්‍රය ඔප්නැංවීම සඳහා පාරිසරික, විද්‍යාත්මක ක්‍රියාකාරකම් පදනම් කරගත් අන්තර් රාජ්‍ය ව්‍යාපෘති හතරක් යුනෙස්කෝව විසින් ක්‍රියාත්මක කරනු ලැබේ. එම ව්‍යාපෘති පිළිවෙලින් අන්තර් රාජ්‍ය සාගර විද්‍යා පිළිබඳ කොමිසම (IOC), මිනිසා සහ ජෛව ගෝලී වැඩපිළිවෙල (MAB), භූ විද්‍යාව පිළිබඳ ජාත්‍යන්තර සහ සබඳතා වැඩපිළිවෙල(IGCP), ජාත්‍යන්තර ජල විදුලි වැඩපිළිවෙල(IHP)ලෙසින් දැක්විය හැකිය.

අන්තර් රාජ්‍ය සාගර විද්‍යාව පිළිබඳ කොමිසම මගින් සාගර හා ඒවායේ සම්පත් පිළිබඳ වූ විවිධ අංශයන් අළලා කරන ලද පර්යේෂණ සම්බන්ධයෙන් පැහැදිලි අවබෝධයක් ලබාදීම සඳහා උත්සාහ කරනු ලැබේ. මෙම ව්‍යාපෘතිය 'ලෝක දේශගුණික පර්යේෂණ වැඩපිළිවෙලට' සහය වන අතර ලෝක කාලගුණික සංවිධානය (WMO) සමස්ත ලෝක සාගර නිරීක්ෂණ ක්‍රමය (GOOS) හා ඒකාබද්ධව ක්‍රියාත්මක කරයි.

මිනිසා සහ ජෛවගෝලී වැඩපිළිවෙල 1971 දී දියත් කරන ලදී. අප ජීවත්වන මහපොළොව මත ඇති ජීවීන් හා පැලෑටි ඇතුළු සම්පත් මනා ලෙස සංරක්ෂණය, සංවර්ධනය, කළමනාකරණය සඳහා අදාළ පුහුණු කිරීම් හා පර්යේෂණ සම්බන්ධ තොරතුරු ශිල්ප ඥානය ලෝකය පුරා බෙද හැරීම ජීව විද්‍යානුකූල විවිධත්වය හා සංරක්ෂිත සංවර්ධනය පිළිබඳ සංකල්පය පතල කිරීමට මෙම වැඩපිළිවෙල යටතේ වූ ක්‍රියාකාරකම් තුළින් පුළුල් උත්සාහයක් දරා ඇත.

භූ විද්‍යාව පිළිබඳ ජාත්‍යන්තර සහ සම්බන්ධතා වැඩපිළිවෙල පාලනය වන්නේ ජාත්‍යන්තර භූ විද්‍යාත්මක, විද්‍යා සමිතියේ හා රටවල් 92 ක ඇති ජාතික කමිටුවල සහයෝගිතාවය ඇතිව ය. මෙහි අරමුණ වන්නේ ද භූ විද්‍යා ක්ෂේත්‍රයේ ඇති භූ භෞතික හා ඛනිජ වස්තු බලශක්තිය ලොව පුරා බෙද හද ගැනීම යි.

ජාත්‍යන්තර ජල විදුලි වැඩපිළිවෙල පරිසරය සුරක්ෂිත කර ගැනීම පිළිබඳව දැඩි අවධානය යොමු කරමින් ලෝකය පුරා විද්‍යාත්මක හා තාක්ෂණික ජල විදුලි බලාගාර වර්ධනය කරමින් සම්පත් යථා පරිදි ප්‍රයෝජනයට ගැනීම උදෙසා වූ අධ්‍යයනය, පර්යේෂණ, පුළුල් පුහුණුව සෑම මට්ටමකින්ම ජලවිදුලි සම්පත නිසිලෙස ප්‍රයෝජනයට ගැනීම සම්බන්ධයෙන් කරගෙන යනු ලැබේ.

ස්වාභාවික හදිසි විපත් වූ භූමි කම්පා, ගිනිකඳු පුපුරා යාම, ගංවතුර හා නාය යාම් අඩු කිරීම මෙම සංවිධානයේ 'ස්වාභාවික හදිසි විපත් අඩුකිරීම සඳහා වූ අන්තර් ජාතික දශකය' යටතට ගෙන ඇති අතර ලෝකයේ සමහර ප්‍රදේශ කාන්තාර බවට පත්වීම වලක්වා ගැනීම සඳහා ශුෂ්ක ප්‍රදේශ මනා ලෙස කළමනාකරණය කිරීම සිදු කරනු ලබයි.

යුනෙස්කෝ ෂෙර්නොබිසිල් වැඩ

පිළිවෙල යටතේ අනතුරුවලට භාජනය වී ඇති පරිසර සුරැකීම සඳහා ලෝක ප්‍රජාව අවධියෙන් සිටිය යුතුව ඇති බව වටහා දීමට යුනෙස්කෝව දැඩි උත්සාහයක් දරා ඇත. යුක්‍රේනයේ 'චෙර්නොබිසිල් බලාගාරය පිපිරියාමෙන් යුක්‍රේනයට ද අසල්වැසි රටවලට ද ඇති වූ බලපෑම්වල ඵල විපාකවලින් පරිසරයට වූ හානියම පරිසරය සුරැකීමේ වැදගත්කම තහවුරු වන යුනෙස්කෝ වැඩ පිළිවෙලට කදිම නිදසුනකි.

යුනෙස්කෝවේ විද්‍යාත්මක ක්ෂේත්‍රයේ ක්‍රියාකාරම් අතර, විද්‍යාව, තාක්ෂණය සහ සමාජය පිළිබඳ වූ වැඩ පිළිවෙල යටතේ ප්‍රධාන අරමුණ වී ඇත්තේ විද්‍යාව සහ සංස්කෘතිය අතර ඇති සහ සම්බන්ධතාවය ගැන ඇති අවබෝධය වැඩිදියුණු කිරීමයි. මෙම අවබෝධය තහවුරු කිරීම උදෙසා අදාළ ගුරු උපදේශ පිළිබඳව ඇති අඩුපාඩු සපුරා පාසල් පද්ධතියෙන් පරිබාහිර වූ පාඨමාලා විද්‍යාව හා තාක්ෂණය සම්බන්ධයෙන් හඳුන්වාදීමට උත්සාහ ගෙන තිබේ.

යුනෙස්කෝ සංවිධානය ආවරණය කරනු ලබන තවත් විෂය ක්ෂේත්‍රයක් නම් ඒ ඒ රටවල සංස්කෘතිය හා සම්බන්ධ වේ. මෙහිදී සංවර්ධනයේත්, සංස්කෘතික මත පිළිබඳ අවධාරණය කිරීම, ලෝකයේ ස්වාභාවික හා සංස්කෘතික උරුමය ආරක්ෂා කිරීම සමගම සංස්කෘතික අනන්‍යතාවත් හා පාරම්පරික දේවල් සංරක්ෂණය කිරීම සඳහා මග පෙන්වීම සිදුකරනු ලබයි. තවද, නිර්මාණය හා නිර්මාණශීලීත්වය දිරිගැන්වීම සමගම පොත් හා කියවීමත් නාට්‍ය හා රංගන පුහුණු කලාවත් ප්‍රවර්ධනය කිරීම හා පල කිරීමේ අයිතිය ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය පියවර රැසක් ගෙන තිබේ.

යුනෙස්කෝ සංස්කෘතික ව්‍යාපෘතිය උදෙසා පුළුල් ජනතා සහය දිනාගැනීමට උත්සුක වී ඇත. අබු සිම්බෙල් සහ ඉහළ ඊජිප්තුවේ ෆිගායේ පන්සල් 22 ක් රැක ගැනීම සහ වර්ෂ 10 ක් පැරණි ඉන්දුනීසියාවේ බෝරෝබුදූර් සම්පූර්ණයෙන් ම නැවත ගොඩනැංවීම යුනෙස්කෝ සහයෙන් ඉටු වී ඇත. ඒ

**ලෝකයේ ස්වාභාවික හා සංස්කෘතික උරුම සුරැකීමේ යුනෙස්කෝ ව්‍යාපෘතිය යටතේ ස්වාභාවික හා සංස්කෘතික උරුම රැකගැනීම ප්‍රඥප්තියට වර්ෂ 1992 දී රටවල් 132 ක් අනුමැතිය පළ කළේ ය.**

අතර යේමනයේ ඓතිහාසික නගරයක් වූ සනා ඇතුලු ව්‍යාපාර 24 ක් ද ලෝකයේ පැරණිම නගරයක් වූ මොහෙන්ජොදාරෝ ද රැකගැනීම සඳහා සමත් වී ඇත.

ලෝකයේ ස්වාභාවික හා සංස්කෘතික උරුම සුරැකීමේ යුනෙස්කෝ ව්‍යාපෘතිය ඉතා වැදගත් ස්ථානයක් ගනී. ස්වාභාවික හා සංස්කෘතික උරුම රැකගැනීම ප්‍රඥප්තියට වර්ෂ 1992 දී රටවල් 132 ක් අනුමැතිය පළ කළේ ය. මෙම ප්‍රඥප්තිය අරමුණු කොට ඇත්තේ චීන මහා ප්‍රාකාර කලිමන්ජාරෝ හි ජාතික උද්‍යානය ලන්ඩනයේ කුලුණ මොන්ට්සෙල්ලෝ සහ චාලෝතෙස්විල් හි වර්ජිනියා සරසවිය, මාචු පික්චු ඓතිහාසික සංචිතය ද සුරක්ෂිත කර ගැනීම උදෙසා ය. වර්ෂ 1992 දී ප්‍රථම වරට සකස් කළ ලෝක උරුම පිළිබඳ ලැයිස්තුවේ මෙවැනි ප්‍රධාන ස්ථාන අතර තවත් ඓතිහාසික හා සංස්කෘතික අතිත් වැදගත් ස්ථාන 378 ක් හඳුනාගෙන ඇත. ශ්‍රී ලංකාවේ සංස්කෘතික ත්‍රිකෝණය පිළිබඳ ව්‍යාපෘතිය ද මෙම ලෝක උරුම ලැයිස්තුවට අයත් වූවකි.

තවද, ඊජිප්තුවේ පුරාණ ඇලෙක්සැන්ඩ්‍රියා පුස්තකාලයට නව ජීවයක් දීමට යුනෙස්කෝව පුළුල් ලෙස සහභාගි විය. පෞරාණික වස්තු අධ්‍යයනය පිළිබඳ මධ්‍යස්ථානය වූ ඇලෙක්සැන්ඩ්‍රියා පුස්තකාල කෞතුකාගාරය ක්‍රිස්තු වර්ෂ 295 දී පළමුවන ටොලමි විසින් පිහිටුවන ලද්දකි.

මෙම මහඟු වස්තුව ජුලියස් සීසර් ඇලෙක්සැන්ඩ්‍රියාවට එරෙහිව කරන ලද යුද්ධයේ දී ගින්නකින් මුළුමනින් ම විනාශයට පත් වූවකි. නව පුස්තකාල ගොඩනැගිල්ල මධ්‍යධරණිය හරහා උදවන හිරුගේ ආලෝකධාරා ඇද ගන්නා පරිදි බෑවුම් වූ දැවැන්ත රවුම් පැතලි තැටියක ආකාරයට නිර්මාණය කරන ලද්දේ නෝර්වීජියානු ශිල්පීන් කණ්ඩායමක් විසිනි.

මුඛ පරම්පරා ගත සම්ප්‍රදාය සුරක්ෂිත කිරීම, පොත්පත් හා කියවීමේ රුචිය වැඩි දියුණු කිරීම සහ ජාත්‍යන්තර ප්‍රතිරූපණ හෙවත් කර්තෘ අයිතිය ආරක්ෂා කිරීම සඳහා ද යුනෙස්කෝව ක්‍රියාකාරී වී ඇත. 1952 දී ප්‍රකාශයට පත් කළ විශ්ව ප්‍රතිරූපන අයිතිය හෙවත් කර්තෘ අයිතිය පිළිබඳ ප්‍රඥප්තිය සඳහා යුනෙස්කෝව අනුග්‍රහය දක්වා C සලකුණ ලොව පුරා ප්‍රකාශයට පත්කරනු ලබන පොත් ආරක්ෂාව සඳහා යෙදීමට විධිවිධාන යොදා ඇත.

කෙසේ වෙතත් යුනෙස්කෝ ව්‍යවස්ථාවේ මූලික පරමාර්ථ හෙවත් විෂය ක්ෂේත්‍ර අතරට සන්නිවේදනය අඩංගු කර නැතත් ජනසන්නිවේදන මාධ්‍ය තුළින් ලෝකය පුරා තොරතුරු බෙදහැරීමට, පතල කිරීමට, ජනසන්නිවේදන යටිතල පහසුකම් සලසා දීමට ප්‍රබලතම මෙහෙයක් ඉටුකරමින් සිටී. මෙහිදී ජනසන්නිවේදනය මගින් තොරතුරු හා තොරතුරු පද්ධති, සන්නිවේදනය යන පුළුල් විෂය ක්ෂේත්‍රයන් ආවරණය කරනු ලබයි.

**ඉතා වැදගත් යුනෙස්කෝ ප්‍රකාශනයක් හැටියට කුරියර් සඟරාව ඉදිරියෙන් සිටී. මෙය විවිධ භාෂා 30 කින් හා බ්‍රේල් මාධ්‍යයෙන් ද ඉදිරිපත් කරයි.**

යුනෙස්කෝ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම සඳහා එහි ප්‍රකාශන ඉතා වැදගත් ස්ථානයක් ගනී. මෙසේ ප්‍රකාශයට පත් කරන ප්‍රකාශන හැටියට වාරික ප්‍රකාශන, විශේෂඥ සඟරා, විවිධ විෂයන් ආශ්‍රිත සමාලෝචන සහ ලේඛනාධිය ඇතුළත් වේ.

මේ අතින් ඉතා වැදගත් යුනෙස්කෝ ප්‍රකාශනයක් හැටියට කුරියර් සඟරාව ඉදිරියෙන් සිටී. මෙය විවිධ භාෂා 30 කින් හා බ්‍රේල් මාධ්‍යයෙන් ද ඉදිරිපත් කරයි. මීට අමතරව තවත් වටිනා ප්‍රයෝජනවත් ප්‍රකාශන රාශියක් ද යුනෙස්කෝව විසින් නිකුත් කරනු ලබයි. එම ප්‍රකාශන අතර ජාත්‍යන්තර සමාජ විද්‍යා සඟරාව, ප්‍රතිරූපන අයිතිය, පිළිබඳ ප්‍රවෘත්ති නිවේදනය, වාර්ෂික සංඛ්‍යා ලේඛන සංග්‍රහය, ජාත්‍යන්තර පරිවර්තන පිළිබඳ සුචිගත කළ ග්‍රන්ථය, ජාත්‍යන්තර නීතිය සහ විදේශයන්හි අධ්‍යයනය යන ප්‍රකාශන වැදගත් කොට දැක්විය හැකි ය.

මෙලෙස ජාත්‍යන්තර සංවිධානයක් වූ යුනෙස්කෝව මගින් අධ්‍යාපනික, විද්‍යාත්මක සංස්කෘතික හා සන්නිවේදන ක්ෂේත්‍රයන් අදාළව සිදුකරන ලද මෙහෙය හා සිදු කරමින් ඉටුවන මෙහෙය අතිමහත් ය. යුනෙස්කෝ ව්‍යවස්ථාවට අනුව ප්‍රකාශවන පරිදි සෑම දෙනාටම අධ්‍යාපනය තුළින් 1946 වර්ෂයේ සිට නූතනය දක්වා සිදුකරන ලද මෙහෙය අධ්‍යාපන ක්ෂේත්‍රය සම්බන්ධයෙන් සාකච්ඡාවට බඳුන් වී ඇති කරුණකි.

අවසාන වශයෙන් මුළු ලෝකයේම අධ්‍යාපන ක්ෂේත්‍රයේ සිට තොරතුරු තාක්ෂණය දක්වා සෑම තොරතුරු පද්ධතියක් ම ජාත්‍යන්තර ප්‍රජාව හමුවේ පැතිර වීමට යුනෙස්කෝ සංවිධානය මගින් සිදු කරනු ලබන සේවාවන් පැසසිය යුතු ය. ❑